PAFFREL
නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.
சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.
PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

2021-05-22
ප්‍රවෘත්ති කතෘ/ සංස්කාරක

**මැතිවරණ හා ඡන්ද විමසීම් ව්‍යුහය සහ මැතිවරණ නීතිවලට අදාල ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන අදහස් ලබාගැනීම**

මැතිවරණ හා ඡන්ද විමසීම් ව්‍යුහය සහ මැතිවරණ නීතිවල සිදුවිය යුතු ප්‍රතිසංස්කරණ පිළිබඳව සොයා බැලීම සඳහා පත්කල පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව මහජන අදහස් විමසීමට තීන්දු කිරීම ඉතා ප්‍රශස්ත කටයුත්තක් බව මැතිවරණ නිරීක්ෂණ සංවිධානයක් ලෙස අපගේ විශ්වාසයයි .

මැතිවරණ ව්‍යුහය මෙන්ම මැතිවරණයට අදාල නෛතික ප්‍රතිපාදනද වර්තමාන දේශපාලන සන්දර්භයන්ට අනුරූපී වන පරිදි බරපතල සංශෝධනයට ලක්විය යුතු බවට කිසිදු විවාදයක් නැත. විශේෂයෙන්ම ජනතා පරමාධිපත්‍යයේ මූලිකාංගයක් වන ඡන්ද බලය බාධාවකින් හෝ බලපෑමකින් තොරව අභ්‍යාස කිරීමට නම් සමබිමක තරඟය පැවැත්වීම වෙනුවෙන් සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි නව නෛතික ප්‍රතිපාදන සැකසීමේ කඩිනම් අවශ්‍යතාවයක් පවතී.

ඒ අනුව මැතිවරණ ක්‍රමයේ සාධනීය වෙනසක් අපේක්ෂා කරනු ලබන පුරවැසියන්ට මෙන්ම සංවිධානවලටද මැතිවරණ ප්‍රතිසංස්කරණ වෙනුවෙන් වන යෝජනා හා අදහස් ලබාදීම සඳහා අවකාශය සලසා ඇති අතර එකී යෝජනා ලිඛිතව හෝ **sec.pscelectionreforms2021@parliament.lk** නම් විද්‍යුත් තැපැල මගින් අදාල කමිටුව වෙත 2021 ජූනි මස 19 වන දිනට පෙර ඉදිරිපත් කල හැකිය.

මහජන අදහස් හෝ යෝජනා ලිඛිතව ලබා දෙන්නේ නම්,

**ලේකම්,**
**මැතිවරණ ප්‍රතිසංස්කරණ වෙනුවෙන් වන විශේෂ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව,**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ,**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,**

යන ලිපිනයට තැපැල් මගින් යොමු කිරීමේ හැකියාව පවතී.

#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com

කොරෝනා වසංගතය පිළිබඳ මේ මොහොතේ සමාජයේ ප්‍රමුඛ අවධානය යොමුව ඇතත් මෙම කටයුත්තේ ඇති ජාතික වැදගත්කම ගැන අවධානය යොමු කරමින් විවිධ දැනුම් මට්ටම් මෙන්ම සමාජ පරාසයක් නියෝජනය කරනු ලබන පුරවැසියන්ගෙන් මෙන්ම සංවිධාන වලින්ද අප ඉල්ලා සිටිනුයේ වඩාත් දියුණු ලක්ෂණ වලින් සමන්විත මැතිවරණ ක්‍රමයක් වෙනුවෙන් නියමිත කාලසීමාව තුළ ඔබේ අදහස් හා යෝජනා ලබාදෙමින් මෙම ජාතික කර්ත්‍යයේ කොටස්කරුවෙකු වන ලෙසයි.

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යෂක